REF:19/45/A.N/C&CEO&COM.G.L/TRD.U.A/01
ටෙලිකොම් ක්‍රියාකාරී වෘත්තීය සමිති එකමුතුව,
තැ. පෙ. 2293,
කොළඹ 01.

2019.10.17

01. ගරු සභාපති තුමා,
ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී.

02. ප්‍රධාන විධායක නිලධාරී තුමා,
ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී.

03. කම්කරු කොමසාරිස් ජනරාල් තුමා,
ශ්‍රී ලංකා ටෙලිකොම් පී. එල්. සී.

සභාපති තුමනි/ ප්‍රධාන විධායක නිලධාරී තුමනි/ කම්කරු කොමසාරිස් ජනරාල් තුමනි,

**වෘත්තීය ක්‍රියාමාර්ග වලට අවතීර්ණ වීම**

ටෙලිකොම් පාලනාධිකාරිය සමඟ සේවක ගැටළු සම්බන්ධයෙන් වසර 04 ක පමණ කාලයක සිට අප වෘත්තීය සමිති සාකච්ඡා කර ඇත. එමෙන්ම එම සාකච්ඡා අසාර්ථක වීම හේතුවෙන් කිහිප වතාවක්ම වැඩ වර්ජන, පිකටින් උද්ඝෝෂණ ඇතුළු වෘත්තීය ක්‍රියාමාර්ග ගැනීමටද අප වෘත්තීය සමිති වලට සිදුවිය. එම වැඩ වර්ජන හා වෘත්තීය ක්‍රියාමාර්ග අත්හිටුවීම වෙනුවෙන් ටෙලිකොම් පාලනාධිකාරිය අප වෘත්තීය සමිති සමඟ එකඟතාවයන්ට පැමිණියහ. වෘත්තීය සමිති පැමිණි එකඟතාවලට අනුව සේවක ගැටළු විසඳීම සඳහා ඔබ පාලනාධිකාරිය, අවස්ථා 03 කදීම පහත දක්වන බාහිර හා අභ්‍යන්තර කමිටුද පත්කරන ලදී.

01. වර්ෂ 2017 පෙබරවාරි 21 දින අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින්ගේ අනුමැතිව ඇතිව ස්වාධීන බාහිර පුද්ගලයින්ගෙන් වන,
    1) මහාචාර්ය N. තිලකසිරි - හිටපු අධ්‍යක්ෂක ජනරාල්, SLIDA ආයතනය.
    2) මහාචාර්ය සම්පත් අමරතුංග - උප කුලපති, ජයවර්ධනපුර විශ්ව විද්‍යාලය.
    3) S. රනුක්ගේ මහතා - හිටපු ලේකම්, රාජ්‍ය පරිපාලන හා නිවාස කටයුතු අමාත්‍යාංශය.
    4) කනිෂ්ක වීරසිංහ මහතා - අධ්‍යක්ෂ ජනරාල්/ ප්‍රධාන විධායක නිලධාරී, ශ්‍රී ලංකා සේවා සම්මේලනය.
    5) සුරේන් රාජකාරියර් - ප්‍රධාන විධායක නිලධාරී, විසඥන සහ මූල්‍ය - KPMG ආයතනය.

    යන අයගෙන් සමන්විත කමිටුවක් පත්කරන ලදී (එම පත්කිරීම් පිළිබඳ වූ ලිපිය ඇමුණුම 01 ලෙස දක්වා ඇත) . එහෙත් මේ දක්වා එම කමිටු වාර්තාව එළි දක්වා නැත.

02. වර්ෂ 2017.10.11 දින අධ්‍යක්ෂක මණ්ඩලයේද, අනුමැතිව ඇතිව අප ඇතුළු ටෙලිකොම් වෘත්තීය සමිති සහ එහි සේවකයින් විසින් පොදු ව්‍යාපාර පිළිබඳ කාරක සභාව (COPE කමිටුව) වෙත ඉදිරිපත් කොට ඇති ටෙලිකොම් ආයතනය තුල සිදුවන දූෂණ, වංචා, අක්‍රමිකතා සහ දුර්වල කළමණාකාරී තත්වයන් නිරීක්ෂණය

කොට වාර්තාවක් ලබාදීමට විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු සුනිල් රාජපක්ෂ මහතාගේ සභාපතිත්වයෙන් යුතු කමිටුවක් පත්කරන ලදී (එම පත්කිරීම පිළිබඳ වූ ලිපිය ඇමුණුම 02 ලෙස දක්වා ඇත). මේ දක්වා එම වාර්තාවේ පිටපතක් අප වෘත්තීය සමිති වලට ලබා නොදී ටෙලිකොම්හි වංචා දූෂණ හා අක්‍රමිකතා සැඟවීමට කටයුතු කොට ඇත.

03. වර්ෂ 2019 ජනවාරි 21 දින ටෙලිකොම් අධ්‍යක්ෂක මණ්ඩලයේ අනුමැතිව ඇතිව සේවක ගැටළු විසඳීම සඳහා ප්‍රධාන විධායක නිලධාරී/ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී හා ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇතුලත්ව අභ්‍යන්තර නිලධාරීන් 08 දෙනෙකුගෙන් යුත් කමිටුවක් පත්කරන ලදී. එම කාර්ය මණ්ඩලයේ පොදු ගැටළු විසඳීම සඳහා පත්කල අදාල කමිටුව සම්බන්ධයෙන් වන චක්‍ර ලේඛය ඇමුණුම 03 ලෙස දක්වා ඇත. එම කමිටුව සමඟ අප වෘත්තීය සමිති සාකච්ඡා වට විශාල සංඛ්‍යාවක් පැවැත්වූ අතර එහිදී පැමිණි ලිඛිත එකඟතාවයන් පවා ක්‍රියාත්මක නොකොට නිර්ලජ්ජිත ලෙස කටයුතු කරමින් සිටිති. එම ලිඛිත එකඟතා පිළිබඳ සාකච්ඡා සටහන් ඇමුණුම 04 සහ ඇමුණුම 05 ලෙස ඉදිරිපත් කරමු.

ඉහත කරුණු අනුව ඔබ පාලනාධිකාරිය දිගින් දිගටම සේවක වෘත්තීය සමිති සහ සේවකයින් නොමග යවමින් අත්තනෝමතික සහ සහ වංචනික ආකාරයෙන් ක්‍රියාකරන බව අප වෘත්තීය සමිති වලට තහවුරුව ඇත.

එබැවින් පහත දක්වන, මේ වන විටත් ඔබ පාලනාධිකාරිය සමඟ සාකච්ඡා කොට ඇති ගැටළු වලට සති 02 ක කාලයක් තුල විසඳුම් ලබා නොදුනහොත්, සේවක වැඩවර්ජන ඇතුළු දැඩි වෘත්තීය ක්‍රියාමාර්ග වලට එළඹීමට සිදුවන බව මෙයින් දන්වා සිටිමු.

(1) ටෙලිකොම් සේවකයින් මෙතෙක් භුක්ති විඳිමින් සිටි 10% ක වාර්ෂික වැටුප් වැඩිවීම ඇතුළුව පසුගිය වසර 03 හි කප්පාදු කරන ලද සේවක වැටුප් වැඩිවීම ද ඇතුලත්ව 2020.01.01 දින සිට 17.5% ක වැටුප් වැඩිවීමක් SLT, HCS, SLTS සියළු සේවකයින්ට ලබාදෙන ලෙසත්, බඳවාගැනීමේ වැටුප්තල පහල දමා අනීතික ලෙස බඳවාගත් කාර්මික සේවක, මෝටර් රථ රියදුරු, පාරිභෝගික සේවා නිලධාරී, අලෙවි නිලධාරී, තාක්ෂණ නිලධාරී, තොරතුරු තාක්ෂණ සහ ජාල නිලධාරී, පාරිභෝගික සේවා සහායක, විකුණුම් නිලධාරී, සහායක විකුණුම් නිලධාරී ඇතුළු බඳවා ගැනීමේ වැටුප් පහල දමන ලද සියලුම තනතුරු වල සේවකයින් වහාම අදාල නිවැරදි වැටුප්තල වල පිහිටුවන ලෙසත්,

(2) ප්‍රධාන මානව සම්පත් නිලධාරී තනතුරට සුදුසුකම්ලත් නිලධාරියෙකු පත්කොට එම පර්ෂදය වහාම ප්‍රතිසංවිධානය කොට ආයතනික ඵලදායීතාවය වැඩි දියුණු කරන ලෙසත්,

(3) වෘත්තීන් කිහිපයකට පසුගිය වසරේ ලබාදුන් පරිදිම අනෙකුත් සියලුම සේවකයින්ද එකම දෛනික සේවා කාලයකට ගෙන එන ලෙසත්,

(4) 12(1) ගිවිසුම මගින් පැමිණ ඇති එකඟතාවය එකවර ඉටුකිරීමට නොහැකි නම්, කොටස් වශයෙන් ඉටු කිරීමක් ලෙස A16 සිට A5 දක්වා වූ සේවකයින්ගේ ප්‍රවාහන හා ආහාර දීමනාව 30% කින් ඉහළ දමන ලෙසත්, ටෙලිකොම්හි සේවය කරන HCS සහ SLTS සේවකයින්ටද ප්‍රවාහන හා ආහාර දීමනාව ලබාදෙන ලෙසත්,

(5) ටෙලිකොම් සේවා කාඩරයෙහි වංචනික ලෙස ශ්‍රම සූරාකෑමට ලක්කොට ඇති සියලු HCS, SLTS සේවකයින් සුදුසු තනතුරු වල නිවැරදි වැටුප් තලයට අනුයුක්ත කරන ලෙසත්, සියලුම දෛනික සහ කුලී සේවකයින් වහාම ඉවත් කරන ලෙසත්, බාහිර මානව සම්පත් උපදේශන සේවාවක් ලබාගනිමින් ටෙලිකොම්හි සේවා කාඩර් නැවත වහාම ගොඩනගන ලෙසත්,

(6) වර්ෂ 2017.10.11 දින අධ්‍යක්ෂ මණ්ඩලයේද අනුමැතිව ඇතිව, අප ඇතුළු ටෙලිකොම් වෘත්තීය සමිති විසින් විශ්‍රාමලත් අභියාචනාධිකරණ විනිසුරු සුනිල් රාජපක්ෂ මහත්මාට පැමිණිලි කරන ලද දූෂණ, වංචා, අක්‍රමිකතා සහ දුර්වල කළමනාකරණ තත්වයන් සම්බන්ධයෙන් නිකුත්කර ඇති වාර්තාව වහාම අප වෘත්තීය සමිති වලට ලබාදෙන ලෙසත්, එම වාර්තාව අනුව වහාම ක්‍රියාකරන ලෙසත්,

(7) පසුගිය වසර කිහිපය තුල කප්පාදු කරන ලද පහත සේවක වරප්‍රසාද වහාම සේවකයින්ට නැවත ලබාදෙන ලෙසත්,

a) වයස 30-40 දක්වා සේවකයින්ට හිමිව තිබූ සුවතා වැඩසටහනේ ප්‍රතිලාභ නැවත ලබාදීම.
b) රු. 100,000 ක් වූ සේවක අවම වාර්ෂික ප්‍රසාද දීමනාව ලබාදීම.
c) ආපදා ණය සහන පොලී අනුපාතය ආයතනයේ පිළිගත් ප්‍රතිපත්තිය අනුව පහළ දැමීම.
d) 52/ 2011 චක්‍රලේඛය අනුව සේවක දරුවන් නැවත බඳවා ගැනීම.
e) බඳවා ගැනීමේ තලවලට උසස්වීම් ලබාදීමේදී වැඩි වූ 10% වැටුප් වැඩිවීම පෙරදාතම කොට (Back Date) නැවත වහාම ලබාදීම.

(8) ටෙලිකොම් ස්ථිර සේවකයින් විසින් සිදුකරන කිසිදු රැකියාවක් Outsource හෝ කොන්ත්‍රාත් සේවකයින්ට ලබා නොදෙන ලෙසත්, දැනටම Outsource සේවකයින්ට පවරා ඇති සියලුම ප්‍රාදේශීය විනිමයන්හි (RSU) රාජකාරී සහ විකුණුම් රාජකාරී ටෙලිකොම් ස්ථිර සේවකයින්ට පවරන ලෙසත්,

(9) රජයට සම්බන්ධ වරාය අධිකාරිය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා රාජ්‍ය ව්‍යවසායක ආයතන වල ලබාදී ඇති පරිදිම සේවකයාගේ කැමැත්ත මත වයස අවුරුදු 60 දක්වා ඉල්ලීමකින් තොරව සේවය කිරීමට අවස්ථාව ලබාදෙන ලෙසත්ය.

| වෘත්තීය සමිතිය | නම | තනතුර | සාමජික සංඛ්‍යාව | අත්සන |
|---|---|---|---|---|
| විදුලි සංදේශ ඉංජිනේරුමය ඩිප්ලෝමාධාරීන්ගේ සංගමය | එච්.කේ. හෙට්ටිආරච්චි | සභාපති | 650 | |
| තොරතුරු හා විදුලි සංදේශ සියළු සේවක සංගමය | ජේ.බී. ගුරුසිංහ | සම ලේකම් | 2800 | |
| පාරිභෝගික සේවා සහ සමාන්තර සේවා නිලධාරීන්ගේ සංගමය | ඩබ්ලිව්. ඩබ්ලිව්.බී. ආරියපාල | සභාපති | 910 | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් සේවක සංගමය | අතුල බොතේජු | සභාපති | 720 | |
| තොරතුරු හා සන්නිවේදන තාක්‍ෂණ නිලධාරීන්ගේ සංගමය | එස්.ඒ.සී.ආර්. සමරවීර | ලේකම් | 220 | |
| සමස්ථ ලංකා විදුලි සංදේශ සේවක සංගමය | නිවන්ත විජේසූරිය | සභාපති | 1575 | |
| ටෙලිකොම් පරිපාලන නිලධාරීන්ගේ සංගමය | අසිත පලිපාන | ලේකම් | 45 | |
| ශ්‍රී ලංකා ටෙලිකොම් මෝටර් රථ රියදුරු සංගමය | එස්.එස්.ජේ. පතිරණ | සභාපති | 200 | |

පිටපත් :

1. ගරු ජනාධිපතිතුමා - ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජය.
2. ගරු අග්‍රාමාත්‍යතුමා - ශ්‍රී ලංකා ප්‍රජාතන්ත්‍රවාදී සමාජවාදි ජනරජය.
3. ගරු අමාත්‍යතුමා - විදුලි සංදේශ, විදේශ සේවා හා ක්‍රීඩා අමාත්‍යාංශය.
4. ප්‍රධාන මෙහෙයුම් නිලධාරීතුමා - ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.
5. සාමාන්‍යාධිකාරීතුමා, මානව සම්පත් - ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.
6. නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී තුමා, සේවක සබඳතා - ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී.
7. ප්‍රධාන විධායක නිලධාරීතුමා - ශ්‍රී ලංකා ටෙලිකොම් හියුමන් කැපිටල් සොලියුෂන් සමාගම.
8. ප්‍රධාන විධායක නිලධාරීතුමා - ශ්‍රී ලංකා ටෙලිකොම් සේවා සමාගම.
9. කම්කරු කොමසාරිස්තුමා, කාර්මික සබඳතා - කම්කරු දෙපාර්තමේන්තුව.
10. සියලුම සහෝදර සේවක මහත්ම/ මහත්මීන් වෙත.

ඇමුණුම 01

KUMARASINGHE SIRISENA
Chairman
Sri Lanka Telecom PLC
1st Floor, CTO Building
Lotus Road, Colombo 01, Sri Lanka.
Company Reg. No. PQ7
Voice : +94-11-2323434 / +94-11-2390253
Facsimile : +94-11-2433111
E-mail : sltchairman@slt.com.lk
Website : www.slt.lk

Sri Lanka Telecom

21st February 2017

Professor N. Thilakasiri-
Professor Sampath Amarathunge –
Mr. S Ranukge –
Mr. Kanishka Weerasinghe -
Mr. Suren Rajakarier –

Dear Professor/Sir,

**APPOINTING A COMMITTEE OF PROFESSIONALS TO STUDY HR AND FINANCIAL MANAGEMENT RELATED ISSUES OF SLT GROUP.**

The following Committee of professionals in management have been appointed with the approval of the Board of Directors to study and propose solutions for solving the HR and Financial Management related issues of the SLT and HCS;

1. Professor N. Thilakasiri- Former Director General SLIDA
2. Professor Sampath Amarathunge – Vice Chancellor - University of Sri Jayewardenepura.
3. Mr. S Ranukge – Former Secretary- Ministry of Public Administration and Home Affairs
4. Mr. Kanishka Weerasinghe - Director General/ CEO – Employers' Federation of Ceylon
5. Mr. Suren Rajakarier – CEO Audit and Finance- KPMG.

The Terms of Reference for the committee is as follows;

SLT related issues;

1. Study the existing and proposed SRPS, compare with industry standards and industry qualifications, review the proposed SRPS, providing strategic direction for implementation.

2. Study and advice on the impact of applying a unified duty time for the executive and non-executive grades. A complete impact assessment to be done and the financial impact or otherwise to be included.

3. Study the existing Salary and remuneration structure for anomalies and recommend adjustments to rectify them or propose a new salary structure, keeping in line with the industrial averages and the affordability by the company.

4. Observe the possibility of introducing of and the acceptability of the proposed salary structure of Rs. 17,500/= basic salary plus SLT allowances. Any modifications required

Sri Lanka Telecom

should be proposed to maintain the attractiveness to future recruits in line with the existing labor laws and regulations.

5. To look into the grievances of any employee segment or individuals as at 1st January 2017 and recommend schemes to resolve/mitigate the adverse effects if any.

6. Critically analyse the present HR environment and recommend good HR practices and HR Development schemes, where committee find applicable.

7. Study the proposed annual increment and the bonus structure and advice to the Board on applicability at sustainable and affordable levels.

8. Draft a collective agreement to be entered into by the SLT and the unions resolving the present dispute in a sustainable manner.

9. Any other related issue that is identified in the process of the study as having a direct impact on the issues and are applicable and relevant to the said issues.

HCS Issues;

1. Study the present outsourcing of employees of HCS, its legal implications, acceptability in terms of legal background, business practices and social viewpoint and suggest on the future business model and the strategy, legality and the way forward as well as measures to be taken to mitigate any adverse implications posed by the legal, business and social environments.

2. Propose business model and strategy if HCS is to continue outsourcing human capital to continue as a viable profitable organisation providing job satisfaction and prestige, retaining the HR assets.

3. Study and propose a plan for those who are overage (Over 47 years).

4. Propose plans for those who are within the age and service category but does not possess necessary qualifications and skills.

5. Propose the succession plan for those who will complete 7 years of continued service at HCS and will be eligible to the recruited as per the introduced scheme for recruiting HCS staff to SLT as new employees.

6. Any other related issue that is identified in the process of the study as having a direct impact on the issues and are applicable and relevant to the said issues.

✓ISO 9001 : 2008 **Board of Directors:** Mr. P.G. Kumarasinghe Sirisena (Chairman), Mr. Chan Chee Beng, Mr. Jeffr...

Sri Lanka Telecom

The first session of the appointed Committee is scheduled to be held during March. You are expected to meet with relevant parties and carry out the study and make the proposals at your earliest.

The Committee will be allocated office space at SLT for conducting your study and to interview any person from the two institutions. The Senior Management has been informed to cooperate whilst all Trade Unions of SLT Group have been instructed to nominate five representatives per union. The Minister of Telecommunication and Digital Infrastructure will be invited to attend the first session.

In order to formalize appointment of the above committee, I would appreciate if the related charges can be intimated early, either individually or collectively as the committee.

Thank you,

Kumarasinghe Sirisena
**Chairman**

Copy to;

Professor N. Thilakasiri- Former Director General SLIDA
Professor Sampath Amarathunge – Vice Chancellor - University of Sri Jayewardenepura.
Mr. S Ranukge – Former Secretary- Ministry of Public Administration and Home Affairs
Mr. Kanishka Weerasinghe - Director General/ CEO – Employers' Federation of Ceylon
Mr. Suren Rajakarier – CEO Audit and Finance- KPMG.

GCEO - SLT Group – for necessary action please
CHRO – SLT – Please allocate furnished office space and for overall coordination

2.3. The committee will direct all relevant SLT employees and request other relevant persons external to SLT to provide evidence and all such other information as required.

2.4 The committee will receive written submissions from all unions and individual employees of SLT who have concerns on the above mentioned matters.

2.5. The committee will obtain any additional specialist independent advice from external experts with the prior approval of Chairman Sri Lanka Telecom PLC.

2.6 The committee will commence the activities by 9th October 2017 and submit the final report with their findings and recommendations by the end of January 2018

2.7. In addition to that if additional immediate case referred by the Chairman SLT will be given priority basis and interim report provide within 30 working dates.

2.8 Recommend measures to improve profitability of product lines defined in section

**3. Composition of the Committee**

3.1 The following members of the team are nominated by the Board of Directors for the term identified and approved by the Board of Directors. Membership of the Committee

| # | Name | Designation |
|---|---|---|
| 1. | Justice N. Sunil Rajapaksha<br>Judge of the Court of appeal (Rtd) | Chairman of the Committee |

3.2 Following members have been nominated by the Board for professional advice to the Committee as and when required.

a. Prof. Sampath Amarathunge Vice Chancellor – University of Sri Jayawardhanapura

b. Mr. Mangala Boyagoda - Veteran Banker, Specialist in debt market, Financial Risk Management, Business Strategy and Re-structuring of companies

## 1. Background

1.1 The Board of Directors of Sri Lanka Telecom PLC has identified the requirement of inquiring and investigation of issues pointed out by the Committee on Public Enterprise (COPE), Telecommunication Engineers' Union (TEU)

1.2 To fulfill this requirement, the Board of Directors decided to appoint a committee to investigate and report with their recommendations for them to take actions accordingly

1.3 This document outlines the terms of reference for the committee to inquire, investigate and review the issues

## 2. Terms of Reference of the Committee to inquire and investigate on the issues

2.1. The Committee will investigate and inquire into and report on the following matters.

a. Whether there has been any drop of company financial performance in SLT since 2011, if so contributory factors and responsible officials if any.

b. Whether there has been any malpractice or irregularity, failure in project governance and management from project planning through to delivery in SLT since 2008.

c. Whether there has been any malpractice or irregularity, failure in plan and implementation of present outsourcing model of SLT.

d. Whether there has been any malpractice or irregularity, failure in plan and implementation of present vender financing model of SLT.

e. Whether there has been any malpractice or irregularity, or non-compliance with or disregard of the proper procedures applicable in relation to, such management, administration and conduct of affairs in relation to Human resources Management in SLT since 2008.

f. Whether there has been any malpractice or irregularity , or failures in strategy formulation, operational planning and implementation to face market competition in SLT since 2008

g. Whether there has been any failure fulfilling SLT's obligations as a corporate citizen since 2008.

2.2 Executive Coordinating Officer to Chairman will render his assistance to the Committee as may be required.

ඇමුණුම 03

සභාපතිතුමාගේ චක්‍රලේඛන අංක....01..../2019

සභාපති කාර්යාලය
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී
කොළඹ 01

2019 ජනවාරි 21

සියලුම සේවක මහත්ම මහත්මීන් වෙත,

කාර්යය මණ්ඩලයේ පොදු ගැටළු විසඳීම සඳහා කමිටුවක් පත් කිරීම.

සමස්ත කාර්යය මණ්ඩලයේ පොදු ගැටළු සම්බන්ධයෙන් නිරාකරණය නොවූ සියලුම ගැටළු සවිස්තරාත්මකව අධ්‍යයනය කර විසඳුම් සහිත අදාළ යෝජනා ශ්‍රී ලංකා ටෙලිකොම් අධ්‍යක්ෂක මණ්ඩලය වෙත යෝජනා කිරීමට පහත කමිටුව නම් කර ඇත.

| | | | |
|---|---|---|---|
| කමිටු සභාපති | - | ප්‍රධාන විධායක නිලධාරී | - කේ.ජ්.කිත්ති පෙරේරා මහතා |
| කමිටු සම සභාපති | - | ප්‍රධාන මෙහෙයුම් නිලධාරී | - ප්‍රියන්ත ෆර්නෑන්ඩස් මහතා |
| කමිටු සාමාජික | - | ප්‍රධාන මානව සම්පත් නිලධාරිනී | - ඉන්ද්‍රානි හිස්සැල්ල මහත්මිය |
| කමිටු සාමාජික | - | සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී | - සංජීව සමරනායක මහතා |
| කමිටු සාමාජික | - | සමූහ ප්‍රධාන විගණන නිලධාරී | - චන්ද්‍රසිරි කලුපහන මහතා |
| කමිටු සාමාජික | - | නියෝජ්‍ය ප්‍රධාන මූල්‍ය නිලධාරී | - උපාලි මහමිතව මහතා |
| කමිටු ලේකම් | - | සාමාන්‍යාධිකාරී - මානව සම්පත්(වැ.බ) | - නලින් ජයසූරිය මහතා |
| කමිටු සාමාජික | - | නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී- මෙහෙයුම් වැය | - හේමන්ත මුදලිගේ මහතා |

ඒ අනුව, සියලුම වෘත්තීය සමිති සහ සේවක මහත්ම මහත්මීන් සමස්ත කාර්යය මණ්ඩලයට අදාල පොදු ගැටළු ලිඛිතව 2019 පෙබරවාරි මස 10 වන දිනට පෙර ඉහත සඳහන් කමිටු ලේකම් වෙත යොමු කරන ලෙස කාරුණිකව දන්වා සිටිමි.

පී.ජී.කුමාරසිංහ සිරිසේන
සභාපති
ශ්‍රී ලංකා ටෙලිකොම් පී.එල්.සී

ඇමුණුම 04

අධ්‍යක්ෂ මණ්ඩලය, සභාපති තුමන් ඇතුළු කළමණාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර පැවැත්වූ විශේෂ සාකච්ඡාව.

දිනය - 2019 ජනවාරි මස 24 වෙනි දින

ස්ථානය - ප්‍රධාන විධායක නිලධාරි රැස්වීම් ශාලාවේදී

සහභාගීත්වය - වෘත්තීය සමිති නියෝජිතයන් සහ කළමනාකාරිත්වයෙන් පහත නිලධාරීන් සහභාගී විය.

1. පී.ජී.කුමාරසිංහ සිරිසේන මහතා - සභාපති -ශ්‍රී ලංකා ටෙලිකොම් ව්‍යාපාර සමූහය
2. ඩබ්ලිව්.කේ.එච්.වෑගපිටිය මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
3. කණිෂ්ක සේනානායක මහතා - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
4. නිලන්ති පීරිස් මහත්මිය - අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
5. කිත්ති පෙරේරා මහතා - ප්‍රධාන විධායක නිලධාරී
6. එම්.බී. ෆර්නැන්ඩස් මහතා - ප්‍රධාන මෙහෙයුම් නිලධාරී
7. සංජීව සමරනායක මහතා - සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී
8. ඉන්ද්‍රානි හිස්සැල්ල මහත්මිය - ප්‍රධාන මානව සම්පත් නිලධාරිනි
9. නලින් ජයසූරිය මහතා - සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා කාර්මික සම්බන්ධතා

වෘත්තීය සමිති නියෝජනය කරමින් පහත නිලධාරීන් සහභාගී විය.

1. එච්.කේ.හෙට්ටිආරච්චි මහතා
2. එන්.ආර්.බර්නාඩගේ මහතා
3. එෆ්.එම්.පී.ආර්.ප්‍රනාන්දු මහතා
4. චින්තක සමරවීර මහතා
5. අතුල බොතේජු මහතා
6. ඩබ්ලිව්.ඩබ්ලිව්.බී ආරියපාල මහතා
7. කළණ සිත්ගප්පුලි මහතා
8. ඩී.ආර්.බී.කන්නන්ගර මහතා
9. ජේ.බී.ගුරුසිංහ මහතා
10. එම්.පී.ඩබ්ලිව්.මනම්පේරි මහතා
11. කේ.පී.චන්දිම පතිරණගේ මහතා
12. බී.පී.අමරසිංහ මහතා
13. එච්.පී.චමින්ද මහතා
14. රවීන් ගුණරත්න මහතා
15. සුමුදු අබේසිරිවර්ධන මහතා

ප්‍රථමයෙන් ශ්‍රී ලංකා ටෙලිකොම් ගරු සභාපති තුමන් විසින් අධ්‍යක්ෂ මණ්ඩලය හා වෘත්තීය සමිති නියෝජිතයන් පිළිගත් අතර මෙම සාකච්ඡාවේ අරමුණු පැහැදිලි කළේය. ඉන් අනතුරුව, අධ්‍යක්ෂ මණ්ඩලය වෙත සියලුම වෘත්තීය සමිති නියෝජිතයන් තම තමන් හඳුන්වා දුනි.

ප්‍රධාන මානව සම්පත් නිලධාරිතුමිය ආයතනයේ වර්තමාන තත්ත්වය පැහැදිලි කළ අතර ජනවාරි 16 වන දින පැවැත්වූ සංකේත වැඩ වර්ජනය සහ එම වෘත්තීය සමිති විසින්ම දන්වන ලද තෙදින වැඩවර්ජනය පිළිබඳවද වැඩිදුරටත් සඳහන් කළාය.

ආයතනය නිශ්චිත ඉලක්ක කරා ගෙන යාමේදී අධ්‍යක්ෂ මණ්ඩල වගකීම වැගපිටිය මහතා විසින් පැහැදිලි කළ අතර මෙම සාකච්ඡාවේ අරමුණ වෘත්තීය සමිති නිලධාරීන්ගේ හඬට සවන්දීම මෙන්ම ඔවුන් ආයතනික ඉලක්ක සපුරා ගැනීමෙහිලා සහ ආයතනයේ අභිවෘද්ධියට ඵලදායී ලෙස දායක කර ගැනීම සලකා බැලීම සම්බන්ධයෙන් බව අවධාරණය කළේය.

2007 සමාගම් නීතිය අනුව, අධ්‍යක්ෂ මණ්ඩලය ආයතනයේ ඉලක්ක සපුරා ගැනීමේදී පෞද්ගලිකවම බැඳී සිටිය යුතු බවට නිලන්ති පීරිස් මහත්මිය පැහැදිලි කළාය. ආයතනය යම් කඩා වැටීමකට මුහුණ දුනහොත් එහි සෘජු සහ ප්‍රථම බලපෑම ආයතනයේ සේවකයන් හට බව ඇය වැඩිදුරටත් පැහැදිලි කළ අතර සේවක වැඩ වර්ජන ආදී ක්‍රියාමාර්ගයන්ට එළඹීමට ප්‍රථමයෙන් ආයතනය මුහුණ දී තිබෙන තරඟකාරී වාතාවරණය පිළිබඳ නිසි පරිදි අවබෝධ කර ගත යුතු බව වෘත්තීය සමිති නිලධාරීන් වෙත ඇය අවධාරණය කළාය.

සේවක හඬට සවන්දී ඔවුන්ගේ ප්‍රශ්න විසඳීමට දායක වීම තම අභිමතය බව මෙහිදී කණිෂ්ක සේනානායක මහතා ප්‍රකාශ කළේය.

මෙම තත්ත්වය උදා වීමට පෙර ප්‍රධාන මානව සම්පත් නිලධාරී තුමිය, ප්‍රධාන විධායක නිලධාරී තුමන් සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමන් සහ සභාපතිතුමන් සමඟ සාකච්ඡා කිහිපයක් පැවැත්වූ අතර ලිපි මගින්ද මේ පිළිබඳ දැනුවත් කළ බව රෝහණ (TEDA) මහතා පැහැදිලි කළේය. ඔහුට අනුව, වෘත්තීය සමිති මේ තත්ත්වයට පත් වීමට හේතු වූයේ මීට පෙර ඔවුන් විසින් ඉල්ලා සිටි පරිදි එකඟ වූ ඉල්ලීම් ලබා නොදුන් නිසා බව ප්‍රකාශ කළ අතර මානව සම්පත් සම්බන්ධ ගැටළු ප්‍රධාන මානව සම්පත් නිලධාරීතුමිය විසින් විසඳිය යුතු බවද, ආයතනික කාර්ය සාධන සම්බන්ධ ගැටළු ප්‍රධාන විධායක නිලධාරී තුමන් සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමන් විසින්ද අධ්‍යක්ෂ මණ්ඩලය මට්ටමින් විසඳිය යුතු ගැටළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ද විසඳිය යුතු බව ඒ මහතා වැඩි දුරටත් ප්‍රකාශ කළේය.

මෙහිදී ජගත් ගුරුසිංහ මහතා විසින් ආයතනයේ මානව සම්පත් සම්බන්ධ ගැටළු පහත පරිදි ඉදිරිපත් කළේය.

- ආයතනික බඳවා ගැනීම් සහ උසස්වීම් පටිපාටිය නියමිත පරිදි යාවත් කාලීන වී නැත.
- විශ්‍රාමික විනිශ්චයකාරතුමන් විසින් ලබා දෙන ලද වාර්තාව වෘත්තීය සමිති වෙත ලබා දී නොමැත.
- වෛද්‍යාධාර ප්‍රතිපූර්ණය ප්‍රමාද වීමක් පවතී.
- පෙර වසරේදී සේවකයන් වෙත වාර්ෂික ඉලක්ක නියමිත වේලාවට ලබා දී නොමැත.
- "People Officer" පත් කර නොමැත.
- වෘත්තීය සමිති නිලධාරීන් දෙදෙනෙකු සඳහා විදේශ සංචාර ලබාදී ඇත.
- වාර්ෂික වැටුප් වර්ධකය ලබා දී නොමැත.
- අවම ප්‍රසාද දීමනාව වන රුපියල් ලක්ෂයක මුදල මෙවර ලබා නොදුනි.
- උසස්වීම් ප්‍රමාද වීමක් පවතී.
- වෘත්තීය සමිති නිලධාරීන්ට ස්ථාන මාරු වීම ලබා දීම.
- සේවක ස්ථාන මාරු වීම් නිසි පරිදි සිදුවී නැත.
- වෘත්තීය සමිති නිලධාරීන්ට එරෙහිව විමර්ශන පවත්වයි.
- යම් යම් ශ්‍රේණි වල බඳවා ගැනීම් වැටුප් පරිමාණය අඩු කර ඇත.
- විදුලි සංදේශ කාර්මික නිලධාරීන් බඳවා ගැනීමේ විභාගය සඳහා සුදුසුකම් නොලත් දෙදෙනෙකුට අවස්ථාව ලබා දී ඇත.
- රාජකාරි කාලය වෙනස් වීම සිදු කර නොමැත.
- ශ්‍රී ලංකා ටෙලිකොම් ආයතනයට කාඩරයක් සකස් කර නොමැත.
- පිටතින් සේවය ලබා ගැනීම (outsourcing) වෙනුවෙන් බිලියන 12 වියදම් කර ඇත.

මහාචාර්ය තිලකසිරි මහතා විසින් යාවත්කාලීන කරන ලද ආයතනික බඳවා ගැනීම සහ උසස්වීම් පටිපාටිය සඳහා වෘත්තීය සමිති සියල්ලම සමඟ එකඟතාවයකට පැමිණීමට නොහැකි වූ බව ගරු සභාපති තුමා සඳහන් කළේය. තවද, සේවක ගැටළු විසඳීම සඳහා සභාපති තුමා, ප්‍රධාන විධායක නිලධාරී තුමා, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමා ඇතුළු කමිටුවක් පත් කළ බවත් ඒ සඳහා ඉදිරිපත් කරන විසඳුම් මීලඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමට ඉදිරිපත් කරන බවත් ප්‍රකාශ කළේය.

මීට පෙර වසර වලදී 8.5% ක ජීවන වියදම් දීමනාව සහ 1.5% වාර්ෂික වැටුප් වර්ධකය සමඟ සම්පූර්ණ 10% වැටුප් වැඩිවීමක් ලබා දුන් බව අතුල බොතේජු මහතා පෙන්වා දුනි.

ප්‍රධාන විධායක නිලධාරී සහ ප්‍රධාන මෙහෙයුම් නිලධාරී වශයෙන් තනතුරු දෙකක් සේවක මණ්ඩලය අතරින්ම පත් කිරීම සම්බන්ධව වෑගපිටිය මහතා සේවක මණ්ඩලය වෙත පැහැදිලි කළේය.

රෝහණ මහතා ප්‍රධාන ගැටළු ලෙස පහත දක්වා ඇති පරිදි සංක්ෂිප්ත කරන ලදී.

- 10% වාර්ෂික වැටුප් වර්ධකය
- 2018 වසර සඳහා ප්‍රසාද දීමනාව මාස 4 සහ අවමය රුපියල් 100,000 වන පරිදි ලබා දෙන ලෙස
- මානව සම්පත් පර්ෂදය ප්‍රතිසංවිධානය කිරීම.
- රාජකාරි කාලය වෙනස් කිරීම.
- ආහාර හා ප්‍රවාහන දීමනාව වැඩි කිරීම.

ඉහත සඳහන් කළ කමිටුව සඳහා බාහිර පාර්ශවයන්ද සම්බන්ධ කර ගන්නා ලෙස වෘත්තීය සමිති ඉල්ලා සිටින ලද අතර අවසාන වශයෙන් දැනට පත්කර ඇති ප්‍රධාන විධායක නිලධාරී, ප්‍රධාන මෙහෙයුම් නිලධාරී සහ සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරී ඇතුළු නිලධාරී කමිටුව හා අදාල ප්‍රශ්න සාකච්ඡා කිරීමට එකඟ වූ අතර එසේ එකඟතාවයට පැමිණි විසඳුම් මීලඟ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ඉදිරිපත් කිරීමට එකඟ විය. ප්‍රශ්න සඳහා විසඳුම් නොලැබුනහොත් මෙම කමිටුව සඳහා බාහිර පාර්ශවකරුවන් එක් කර ගැනීම සලකා බලනු ඇත.

පී.ජී.කුමාරසිංහ සිරිසේන
සභාපති

ඇමුණුම 05

කළමණාකාරිත්වය සහ වෘත්තීය සමිති අතර පැවැත්වූ විශේෂ සාකච්ඡාව.

දිනය - 2019 පෙබරවාරි මස 25 වෙනි දින

ස්ථානය - ප්‍රධාන ජාල නිලධාරි රැස්වීම් ශාලාවේදී

සහභාගීත්වය - කළමනාකාරිත්වය

1. එම්.බී. පී ෆර්නැන්ඩස් මහතා - ප්‍රධාන මෙහෙයුම් නිලධාරි
2. සංජීව සමරනායක මහතා - සමූහ ප්‍රධාන මූල්‍ය නිලධාරි
3. චන්ද්‍රසිරි කළුපහන මහතා - සමූහ ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරි
4. නලින් ජයසූරිය මහතා - සාමාන්‍යාධිකාරි - මානව සම්පත් හා කාර්මික සම්බන්ධතා

වෘත්තීය සමිති නියෝජනය කරමින් පහත නිලධාරීන් සහභාගී විය.

1. එච්.කේ.හෙට්ටිආරච්චි මහතා
2. එන්.ආර්.බර්නාඩිගේ මහතා
3. ජේ.බී.ගුරුසිංහ මහතා
4. එල්.එම්.පී.ආර්.ප්‍රනාන්දු මහතා
5. අතුල බොතේජු මහතා
6. කේ.පී.චන්දිම පතිරණගේ මහතා
7. එච්.පී.චමින්ද මහතා
8. සුමුදු අබේසිරිවර්ධන මහතා
9. ඉසුරු අත්තනායක මහතා
10. ඩබ්ලිව්.ඩබ්ලිව්.බී ආරියපාල මහතා
11. චින්තක සමරවීර මහතා
12. බී.පී.අමරසිංහ මහතා
13. එස්.එස්.ජේ.පතිරණ මහතා
14. මනෝජ් මනම්පේරි මහතා
15. එස්.ආර්.කේ.බණ්ඩාර මහතා
16. ආර්.ඩී. චන්නිආරච්චි මහතා
17. ඒ.ඒ.සී.කේ විජේසූරිය මහත්මිය
18. රවීන් ගුණරත්න මහතා
19. පී.එම්.ඒ.පුෂ්පකුමාර මහතා

මෙම රැස්වීම පැවැත්වීමේ අරමුණ පිළිබඳව ප්‍රධාන මෙහෙයුම් නිලධාරි තුමා ප්‍රථමයෙන් වෘත්තීය සමිති නිලධාරීන් වෙත පැහැදිලි කල අතර මීට පෙර පැවැත්වූ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී ගත් තීරණයන් පිළිබඳව වෘත්තීය සමිති දැනුවත් කළේය.

ඒ අනුව,

"People Officer" පත් කිරීම සම්බන්ධ වෘත්තීය සමිති ඉල්ලීම පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය අවධානය යොමු කළ බවත් ඒ සම්බන්ධ පුවත් පත් දැන්වීම සති දෙකක කාලයක් තුල පළ කරන බවත් එම නිලධාරියා ප්‍රධාන විධායක නිලධාරී වෙත වාර්තා කළ යුතු බවත් ප්‍රධාන මෙහෙයුම් නිලධාරි තුමා ප්‍රකාශ කළේය.

එම තනතුරෙහි විෂය පථය වශයෙන්, වෘත්තීය සමිති සමඟ යහපත් සම්බන්ධතාවයක් පවත්වා ගනිමින් ආයතනය තුළ කාර්මික සාමය සහ ආයතනය නව්‍යකරණය කරා යන ගමනේදී ඩිජිටල්කරණය සමඟ ඝන සම්බන්ධතාවයක් පවත්වා ගැනීම මූලික වන බව ප්‍රකාශ කළේය.

බඳවා ගැනීම සහ උසස්වීම් පටිපාටියේ කටයුතු අවසන් කිරීම.
සති දෙකක කාලයකින් පසු එනම් 2019 මාර්තු මස 15 වන දින වන විට බඳවා ගැනීම සහ උසස්වීම් පටිපාටියේ කටයුතු අවසන් කිරීමට සැලසුම් කරන බව ප්‍රකාශ කළේය.

සියලු නිලධාරීන් සඳහා රාජකාරි කාලය වෙනස් කිරීම.
මූල්‍යමය බලපෑමක් නොවේ නම් වෘත්තීය සමිති එකඟ වූ පරිදි රාජකාරි කාලය වෙනස් කිරීම 2019 අප්‍රේල් මස 01 දින සිට ක්‍රියාත්මක කළ හැකි බව ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමා සඳහන් කළේය.

සාකච්ඡා සටහන් ලැබීමේ ප්‍රමාදය පිළිබඳව වෘත්තීය සමිති විමසූ අතර ඒ පිළිබඳ සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට හරිප්‍රිය හෙට්ටිආරච්චි මහත්මියට පැවරිණි. රැස්වීම අවසන් වී දින 5ක් ඇතුළත සාකච්ඡා සටහන් ලබා දීමට එකඟ විය.

ආහාර දීමනාව සහ ප්‍රවාහන දීමනාව ලබා දීම සම්බන්ධව සාකච්ඡා කිරීමට තව දුරටත් කාලය අවශ්‍ය බව ප්‍රධාන මෙහෙයුම් නිලධාරීතුමා වෘත්තීය සමිති නිලධාරීන් වෙත පැහැදිලි කළේය.

බඳවා ගැනීමේ වැටුප් පරිමාණය වැඩි කිරීම සමාලෝචනය සඳහා වැඩි දුරටත් කාලය අවශ්‍ය වන බව කළමණාකාරිත්වය පැහැදිලි කළේය.මෙහිදී සියලුම වැටුප් තල පිළිබඳව සලකා බලන ලෙස වෘත්තීය සමිති නිලධාරීන් ඉල්ලා සිටියේය. තවද, හියුමන් කැපිටල් සොලියුෂන්ස් ආයතනයෙන් බඳවා ගන්නා ලද නිලධාරීන්ගේ වැටුප් පිළිබඳව සාකච්ඡා කිරීම ප්‍රධාන විධායක නිලධාරී තුමා පැමිණීමෙන් අනතුරුව සිදු කරන බව සඳහන් කළේය.

2018 වසර සඳහා වූ අවම ප්‍රසාද දීමනාව සම්බන්ධයෙන් නැවත සලකා බලන බව සහ ඒ පිළිබඳ තීරණයක් ලබා දීම 2019 මාර්තු මස 10 වන දින වන විට සලකා බලන බව ප්‍රධාන මෙහෙයුම් නිලධාරීතුමා සඳහන් කළේය. රු.25,000ක ප්‍රසාද දීමනාව හියුමන් කැපිටල් සොලියුෂන්ස් සේවකයින් සඳහා ද ලබා දෙන මෙන් වෘත්තීය සමිති කළ ඉල්ලා සිටියේය.

සේවකයන් සඳහා අදාල නිල ඇඳුමක් මැසීමේ ගාස්තු වශයෙන් රු.750ක් වශයෙන් ලබා සම්බන්ධ වෘත්තීය සමිති ඉල්ලීම සලකා බැලීමට කළමණාකාරිත්වය එකඟ විය.

කාඩර සකස් කිරීම සම්බන්ධයෙන් දැනටමත් තමන් සම්බන්ධ වී සිටින බවත් තව සති දෙකක කාලයක් ඇතුළත එය සම්පූර්ණ කිරීමට බලාපොරොත්තු වන බවත් ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමා පැහැදිලි කළේය. මේ සඳහා වෘත්තීය සමිති නියෝජනය ලබා දීමට වෘත්තීය සමිති එකඟ වූ අතර ඒ සඳහා අදාල නිලධාරීන්ගේ නම්, සාකච්ඡාවෙන් අනතුරුව ලබා දෙන බව සඳහන් කළේය.

මීට පෙර කීප අවස්ථාවකදීම ඉල්ලා සිටි පරිදි විශේෂ අභියාචනා කමිටුවක් පත් කරන මෙන් වෘත්තීය සමිති ඉල්ලා සිටි අතර ඒ සම්බන්ධයෙන් මාර්තු 05 වන දින සාකච්ඡාවක් කැඳවීමට ප්‍රධාන මෙහෙයුම් නිලධාරී තුමා එකඟ විය.

SLTS ආයතනයෙන් යොදවා ඇති කණ්ඩායම් අඩු කර එම වගකීම ශ්‍රී ලංකා ටෙලිකොම් කණ්ඩායම වෙත ලබා දෙන මෙන් වෘත්තීය සමිති ඉල්ලා සිටියේය.

ප්‍රියන්ත ෆර්නෑන්ඩෝ
ප්‍රධාන මෙහෙයුම් නිලධාරී

පිටපත්: සමූහ සභාපති තුමා
ප්‍රධාන විධායක නිලධාරී තුමා